විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2011    දිනය / திகதி / Date 2011-08-01

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2009 (සංශෝධන II)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

**විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම හා**
**විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම**

උක්ත මැයෙන් මවිසින් නිකුත් කරන ලද 2009- 08- 21 දිනැති 15/ 2009 හා 2011- 05- 05 දිනැති 15/ 2009 සංශෝධන (I) චක්‍රලේඛ වලට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

විශ්‍රාමික රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කරන අවස්ථාවන්හිදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස මින් උපදෙස් දෙමි.

01. විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේදී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අයකළ යුතුය.

02. ඉහත සඳහන් කරුණු හැරුණු කොට විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සංශෝධනය වී, විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල සංශෝධනය වන සෑම අවස්ථාවකදීම පෙර ගෙවන ලද පාරිතෝෂික මුදල සම්පූර්ණයෙන්ම නව පාරිතෝෂික මුදලින් අයකළ යුතුය.

උදා: 01. විශ්‍රාම යාමෙන් අනතුරුව සිදුවන වැටුප් වැඩිවීමකදී සිදුවන සංශෝධන

02. විශ්‍රාම ගොස් සිටින අවස්ථාවකදී සේවයේ සිටි කාලයට බලපැවැත්වෙන පරිදි දෙනු ලබන උසස් වීමක් හේතුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සංශෝධනය වන අවස්ථා.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
03. විගණකාධිපති.



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk